ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම 2024
# 11 කණ්ඩායම

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | මාස - 12 (වසර 01) |
| SLQF ස්තරය | : | Level 03 |
| ඉගැන්වීම් මාධ්‍යය | : | සිංහල |
| අවම සුදුසුකම් | : | 1. ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වීම.<br>**හෝ**<br>2. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වීම<br>**හෝ**<br>3. ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලයීය සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.<br><br>* අ.පො.ස. (උසස් පෙළ)/ ප්‍රාචීන ප්‍රාරම්භ විභාග පදනම් කර ගනිමින් ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) බුද්ධ ධර්මය විෂය ඇතුළුව සම්මාන තුනක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම හෝ පිරිවෙන් අවසාන විභාගය සමත් වී තිබීම අනිවාර්ය වේ. |
| පාඨමාලා ගාස්තුව | : | අයදුම්පත් ගාස්තුව රු. 1,000.00<br>පාඨමාලා ගාස්තුව රු. 23,500.00<br>(පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු. 18,000/-කි. එය ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර, ඉතිරි මුදල පාඨමාලාව ආරම්භ වී මාස දෙකක් ඇතුළත ගෙවිය යුතුය.) |

**අ.පො.ස උසස් පෙළ විභාගය සමත් (පොදු පරීක්ෂණයේ ලකුණු 30 ඇතුළුව) සහ මෙම විශ්වවිද්‍යාලයීය බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව සමත් ශිෂ්‍යයන්ට තෝරාගැනීමේ තරග විභාගයට සහභාගී කරවීමෙන් තොරව මෙම විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව හිමි වේ.**

- මෙම පාඨමාලාව සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/ පැවිදි/ ස්ත්‍රී/ පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.
- පාඨමාලාව සඳහා මාර්ගගත ක්‍රමයට **(Online)** හෝ සම්මුඛ ක්‍රමයට සම්බන්ධ විය හැකිය.
- පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් අයදුම්කර තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගැනීම 2024.09.30 අවසන් වේ.
- බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව මගින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියට ඉල්ලුම් කරන ශිෂ්‍යයන් බෞද්ධ දර්ශනය විෂයය හැදෑරීම අනිවාර්යය වේ.

**පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම**

1. විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියට (www.busl.ac.lk) පිවිස මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම් කළ යුතුය.
2. අයදුම්පත් ඉදිරිපත් කිරීම පෙර පියවර 01 යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/NVeUXfNg2ZWp6qs68 ක්ලික් (Click) කර අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යොමු අංකයක් (Reference Number) ලබා ගත යුතුය.
3. ඉන් පසු ලබා දී ඇති ආකෘතිය අනුව යොමු අංකය (Reference Number) නිවැරදිව සඳහන් කර දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කළ යුතුය.
4. අයදුම්පත පිරවීමට පෙර, උපදෙස් හොඳින් කියවා පහත ලියකියවිලිවල පරිලෝකන පිටපත් (Scan Copy) ලබා ගැනීම සිදු කළ යුතු අතර ඒවා pdf ආකෘතියට තිබිය යුතුය.
   - උප්පැන්න සහතිකය
   - පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකය
   - ජාතික හැඳුනුම්පත
   - අධ්‍යාපන සහතික
   - අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත
5. ඉහත කී සියලුම ලියකියවිලි සකස් කරගත් පසු **පියවර 02** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/hJG8pzY3pMyz594L9 ක්ලික් (Click) කර ගූගල් පෝරමයේ ඇති ප්‍රශ්නවලට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර 2024.09.30 දින දක්වා අයදුම්පත් යොමු කළ හැකිය.

වැඩි විස්තර - පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
025 205 7978
071 627 6469 (WhatsApp only)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය - www.busl.ac.lk

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය.